// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2328/20 - 2023 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2023.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත 92 වැනි වගන්තිය යටතේ නියමය**

1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය, ජීවන් තොන්ඩමන් වන මම, එකී මණ්ඩලයට, මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ ලවන බාධකය ඉදි කිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**ජීවන් තොන්ඩමන්,**
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

2023 මාර්තු මස 18 වැනි දින,
යොමු අංකය : DVP/02/02/MH/530

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
''ලක්දිය මැදුර''
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 427 - නාවිමන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුංගන්ගොඩ ගමේ පිහිටි, ''පරමඤ්ඤකැටිය'', නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි අක්කර 01 රූඩ් 02 පර්චස් 32.8ක් පමණ වන ඉඩම් කොටස :

*උතුරට* - ප්‍රේමානන්ද ලියනගේ, හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන ඉඩම ;

*නැගෙනහිරට* - ප්‍රේමානන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ පිඹුරු අංක මාර 2835 හි කැබලි අංක 01 ;

1A - G 39369 — 09(2023/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | | |
|---|---|---|
| *දකුණට* | - | පිඹුරු අංක මාර 2835 හි කැබලි අංක 01, ප්‍රේමානන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ නිල්වලා ගඟ ; |
| *බටහිර* | - | ප්‍රේමානන්ද ලියනගේ සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ නිල්වලා ගඟ ; |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් ඃ හේමචන්ද්‍ර ලියනගේ සහ ප්‍රේමානන්ද ලියනගේ සහ තවත් අය

EOG 04 - 0143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.